පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
---------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.2,079,000 කට තක්සේරු කරන ලද සුසාන භූමි දෙකෙහි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (ආ) | භාණ්ඩ වෙන්දේසියට පෙර රු.573,889 ක් වටිනා කාර්යාල හා යන්ත්‍රෝපකරණ අයිතම 23 ක් මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත් කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (ඇ) | ගබඩාවෙන් නිකුත් කළ රු.509,102 ක ලිපි ද්‍රව්‍ය තොගය වියදමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | තොග නිකුත් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (ඈ) | කර්මාන්ත අත රැඳවුම් මුදල් රු.178,564 ක්, කර්මාන්ත ණයහිමියන් ලෙස හඳුනා ගෙන තිබුණි. | වර්ෂය තුළ අත රැඳවුම් මුදල් නිවැරදිව හඳුනාගත යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (ඉ) | ප්‍රාග්ධන වියදම් රු.3,618,815 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාග්ධන වියදම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (ඊ) | වර්ෂ අවසාන මුදල් ශේෂය රු.2,526,818 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ජල ගාස්තු ආදායම රු.100,805 ක් දෙවරක් ආදායම ලෙස හඳුනා ගෙන තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (උ) | වර්ෂය තුළ දී, ගෙවූ ණය වාරික රු.1,887,365 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ණය වාරික ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ගෙවිය යුතු ණය ශේෂය වැඩියෙන් ද, අතිරික්තය අඩුවෙන් ද, දක්වා තිබෙන බව පිළි ගනිමි. |

1.3.2 <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අනුව ශේෂය අතර රු.262,976 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීම කළ යුතු වේ. | ඉක්මනින් විසඳා ගැනීමට කටයුතු කරමි. |

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 05 ක කාලය ඉක්ම වූ ලැබිය යුතු ශේෂයන් හි එකතුව රු.810,845 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් තුළ හිඟ ශේෂයන් හි එකතුව රු.20,796,710 ක් විය. | හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමේ වැඩපිළිවෙලක් පවත්වා ගෙන යනු ඇත. |

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.2,487,580 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මුදල් විවිධ ආයතනවලින් ප්‍රතිපූර්ණය වූ විගසම නිරවුල් කිරීමට කටයුතු කරමි. |

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උපලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, රු.2,001,870 ක් වූ පොදු තැන්පතු ගිණුම් ශේෂය විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරිමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | 2019 මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි කරමි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් හා ආපනශාලා හෝ නවාතැන් පොලවල් හඳුනා ගෙන අය කළ යුතු බලපත්‍ර ගාස්තු අය කර ගෙන නොතිබුණි. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා ආපනශාලා හඳුනා ගෙන බලපත්‍ර ගාස්තු අය කළ යුතු වේ. | සංචාරක මණ්ඩලය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | | | |
| (i) | මූල්‍ය රීති 19 | සියලුම උප පත්‍රිකා පොත් සභාවේ ලේකම්වරයා භාරයේ පැවතිය යුතු වුවත්, ඒවා ගබඩා භාර නිලධාරියා භාරයේ පැවතුණි. | සියලුම උප පත්‍රිකා පොත් සභාවේ ලේකම්වරයා භාරයේ තබා ගත යුතු වේ. | මින් ඉදිරියට ලේකම් භාරයේ තැබීමට කටයුතු කරමි. |
| (ii) | මූල්‍ය රීති 178(8)(2) | තාක්ෂණ නිර්දේශයකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී, වානේ කබඩ් 15 ක් මිල දී ගෙන තිබුණි. | තාක්ෂණික නිර්දේශ ලබා ගත යුතු වේ. | තාක්ෂණ නිලධාරියාගේ සේවා දීර්ඝ කාලය 2018.12.14 දිනෙන් අවසන් වූ බැවින් එම අවස්ථාවන්හිදී ලිඛිත නිර්දේශයක් ලබා ගැනීමට නොහැකි විය. |
| (iii) | මූල්‍ය රීති 178(2)(ඊ) | සභාවට අවශ්‍ය පුටු මිලදී ගැනීමේ දී, ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් ටෙන්ඩර්කරු වෙත ලබා දී නොතිබුණි. | ලංසු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් සාධාරණ කාලයක් ලංසුකරුවන් වෙත ලබා දිය යුතු වේ. | පළාත් පාලන ඡන්ද විමසීම 2018.02.10 දිනට යෙදී තිබූ බැවින්, ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීම සඳහා 2018.02.07 දින තෙක් පමණක් කාලය ලබා දීමට සිදු විය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,773,803 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,341,786 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,050,000 | 683,936 | 549,384 | 855,634 | 4,681,000 | 4,938,166 | 4,786,131 | 3,414,812 |
| (ii) | කුලී | 2,303,220 | 2,150,220 | 1,780,449 | 576,737 | 4,245,000 | 2,276,529 | 2,156,125 | 276,042 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 480,000 | 782,376 | 695,676 | 519,000 | 855,300 | 854,857 | 749,357 | 435,100 |
| (iv) | වෙනත් ආදායම් | 25,295,000 | 21,630,955 | 12,096,304 | 32,920,813 | 18,439,000 | 11,423,196 | 10,469,435 | 10,992,080 |
| | එකතුව | 29,128,220 | 25,247,487 | 15,121,813 | 34,872,184 | 28,220,300 | 19,492,748 | 18,161,048 | 15,118,034 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.15,118,034 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම වටිනාකම රු.34,872,184 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 131ක් විය. | හිඟ ආදායම් අය කර ගැනීමේ කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනම් වැඩසටහන් සකස් කර ඇති අතර,එය ක්‍රියාත්මක කරමින් පවතී. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| (i) වසර 05 කට වරක් නව වරිපනම් තක්සේරුවක් කර තක්සේරුගත ගාස්තුව අය කළ යුතු වුව ද, 2009 තක්සේරුව පදනම් කර ගනිමින් වරිපනම් බදු අය කර තිබුණි. | වරිපනම් අය කරන දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කිරීම කළ යුතු වේ. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත කිහිපවරක් දැනුම් දී, ලේඛන තක්සේරුකරු වෙත යවා ඇත. |
| (ii) දේපළ හිමි පුද්ගලයින් 10 දෙනෙකුගෙන් අය විය යුතු රු.97,107 ක වරිපනම් ශේෂයක් වසර 02 කට වැඩි කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් දීර්ඝ කාලයක් හිඟ හිටීමට නොදී කාලීනව අය කර ගැනීමට පියවර ගත යුතු වේ. | මාස 02 ක් තුළ මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ජල ගාස්තු | | |
| සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට හිඟ ජල ගාස්තු රු.2,739,481 න් රු.1,385,712 ක් හෙවත්, සියයට 50 ක් | හිඟ ආදායම් හා වර්ෂය තුළ බිල් කිරීම් අය කර ගත යුතු වේ. | හිඟ මුදල් අය කර ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, හා වාර්ෂික බිල් කිරීම් |

| | | |
|---|---|---|
| අය කර නොතිබූ අතර, වර්ෂයට බිල් කළ ජල ගාස්තු ආදායම වූ රු.4,182,966 න් රු.2,404,980 ක් හෙවත් සියයට 43 ක් අය කර නොතිබුණි. | | අය කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) ත්‍රීරෝද රථ ගාස්තු

--------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ ත්‍රීරෝද රථ ගාස්තු මුදල වූ රු.403,100 න් රු.380,300 ක මුදලක් අය කර නොතිබූ අතර, වර්ෂයේ බිල් කළ ත්‍රීරෝද රථ ගාස්තු ආදායම වූ රු.142,200 න් රු.122,700 ක් අය කර ගෙන නොතිබුණි. | හිඟ මුදල් හා වාර්ෂික ගාස්තු අය කර ගත යුතු වේ. | හිඟ මුදලින් රු.216,200 ක මුදලක් කපාහැරීම සඳහා ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති අතර, ඉතිරි මුදල අය කර ගෙන විගණනයට වාර්තා කරමි. |

2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,551,749 ක් හා රු.23,664,122 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගත යුතු වේ. | උසාවි දඩ මුදලින් රු.1,204,045 ක් දැනට ප්‍රතිපූර්ණය වී ඇති අතර, ඉතිරි මුදල හා මුද්දර ගාස්තු ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරමි. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභා බල ප්‍රදේශයේ කුඩා විදුලි බලාගාර පැවතියත්, අතුරු ව්‍යවස්ථා සකස් කර ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කර ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | සභාවට අයත් ගලබඩ දිය ඇල්ල සංචාරක ස්ථානය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගෙන් ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා සකස් කර ආදායම් අය කර ගැනීම කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කරමින් සිටී. |

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------ | ------------------------------ |
| ඉවතලන අප ද්‍රව්‍ය, අමු ද්‍රව්‍ය ලෙස භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | එකතු කරන කසළ නාවලපිටිය නගර සභාව විසින් කසළ නිෂ්පාදනය කරන භූමියට බැහැර කරන අතර, එම භූමිය සභා සීමාව තුළ පවතී. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------------------ |
| (අ) | තනතුරු 12 ක පුරප්පාඩු 24 ක් පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට පුරප්පාඩු තනතුරු 05 ක් සඳහා සේවකයින් බඳවා ගෙන ඇති අතර, ඉතිරි තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 වර්ෂයේ ස්ථාන මාරු වී ගිය නිලධාරිනියකගෙන් අය විය යුතු රු.207,770 ක ණය ශේෂය වසරක් ගත වන තුරු අය කර නොතිබුණි. | ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය, ස්ථාන මාරු වූ වහාම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර ඇතත්, ප්‍රතිපූර්ණය කිරීම මේ දක්වා සිදු වී නොමැත. |
| (ඇ) | වර්ෂය තුළ කාර්ය මණ්ඩල පුහුණු සඳහා වෙන් කළ රු.100,000 ක් මුදලින් රු.54,520 ක් උපයෝජනය කර නොතිබූ අතර, නිලධාරීන් 10 දෙනෙකු පමණක් පුහුණු කර තිබුණි. | සභාවේ කටයුතු කරන සෑම නිලධාරියෙකුම සහ සේවකයෙකුම අවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා යොමු කළ යුතු වේ. | 2019 වර්ෂයේ පුහුණුව සඳහා අංග සම්පූර්ණ වැඩසටහනක් සකස් කර, ක්‍රියාත්මක කරමින් පවතී. |

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ------------------------------ |
| (අ) | සභාව විසින් මනු රහිත ගෘහස්ථ පාරිභෝගිකයින්ගෙන් මාසික ජල ඒකකයක් සඳහා රු.75 ක් හා වාණිජ ඒකකයක් සඳහා රු.150 ක් ලෙස වසර 18 ක් පුරා අය කර තිබූ බැවින්, නිවැරදි ජල ආදායම සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජල ගාස්තු කාලීනව සංශෝධනය කර, අය කිරීමට කටයුතු කළ යුතු වේ. | රු.75 ක් වූ පිරිපහදු නොකළ ජලය සඳහා වන ගාස්තු රු.150 ක් වශයෙන් 2019 මාර්තු මස සිට ක්‍රියාත්මක වේ. |
| (ආ) | සභාවට අයත් ග්‍රීන් වුඩ් කළුගල් ව්‍යාපෘතියේ ගල් කැඩීම සඳහා බලපත්‍ර ලබා ගත් පෞද්ගලික පාර්ශවය විසින් සභාවට අයත් ඉඩම් කොටසේ ද අනවසර | අනවසර ගල් කැඩීම පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් දේපළක් බැවින්, ඒ පිළිබඳව අදාළ ආයතනය වෙත දන්වා |

| | | | |
|---|---|---|---|
| | ආකාරයට ගල් කැඩීමේ කටයුතුවල නිරත වන බව දක්නට ලැබුණි. | | ඇත. |
| (ඇ) | ගලබඩ දිය ඇල්ල සංචාරක ස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව, පරිසරයේ ආරක්ෂාව, සඳහා ක්‍රියාමාර්ගයක් නොගෙන ප්‍රවේශපත් පමණක් අලෙවි කිරීම සිදු කරන බව දක්නට ලැබුණි. | ටිකට්පත් අලෙවිය, ආරක්ෂාව සැපයීම නිවැරදිව සිදු කිරීම කළ යුතු වේ. | සංචාරකයින්ගේ හා පරිසරයේ ආරක්ෂාව සඳහා දැනට වැඩපිළිවෙලක් සකස් කර ඇත. |

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | ------------- | ------------------------------- |
| (අ) | ප්‍රාදේශීය සභා ගබඩා පරිශ්‍රය තුළ 2015 වර්ෂයේ සිට රු.2,372,230 ක් වැය කර මිල දී ගෙන ඇති ජල මනු 530 ක් මනු රහිත ජල පාරිභෝගිකයින් 1357 ක් සඳහා සවි නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීයව පවතින ජල මීටර්, මීටර් රහිත ජල සම්බන්ධතා සඳහා සවි කිරීමට කටයුතු කළ යුතු වේ. | මාස 06 ක් ඇතුළත මෙම පාරිභෝගිකයින් සඳහා මනු සවි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2012 වර්ෂයේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.200,000 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වර්ෂ ගණනාවක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | යන්ත්‍රය භාවිතා කළ යුතු වේ. | මෙය ප්‍රදේශයට නොගැළපෙන යන්ත්‍රයක් බැවින්, එය අමාත්‍යාංශයට භාර දීමට දැනුම් දී ඇත. |
| (ඇ) | ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබූ රු.7,000,000 ක් වටිනා ජල යෝජනා ක්‍රම 04 ක් සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ යුතු වේ. | මහා සභාවට ඉදිරිපත් කර, තීරණයක් ගැනීමට නියමිතය. |

3.4.2 <u>වාහන උපයෝජනය</u>

<u>වාහන පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | ------------------------------- |
| සභාව සතු වාහන 02 ක මයිලෝ මීටරය අක්‍රීය වී ඇතත්, නැවත යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මයිලෝ මීටර් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී, මයිලෝ මීටර් සවි කිරීමට සුදුසු වැඩපිළිවෙලක් සකස් කරමි. |

3.5 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | ------------------------------- |
| ග්‍රීන් වුඩ් කළුගල් ව්‍යාපෘතියට අදාළ ඉඩම් භාවිතය වෙනුවෙන් පසුගිය වර්ෂ සඳහා රු.1,650,000 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ සභාවට ගෙවා තිබූ නමුත්, | ව්‍යාපෘතිය නියමිත පරිදි කළමනාකරණය කිරීම මගින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම විධිමත් පරිදි ලබා දී නැත. |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය මඟින් ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | යුතු වේ. | |

3.6 <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරමි. |

4. <u>ශිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහජන සුභ සිද්ධිය සහ මානසික තත්ත්වය වර්ධනය කිරීම යනාදි කටයුතු වෙනුවෙන් වැය විෂයන් 17 ක් සඳහා වර්ෂය තුළ වෙන් කළ රු.885,000 ක මුදලින් රු.856,589 ක් උපයෝජනය කර නොතිබුණි. | අයවැය මඟින් ප්‍රතිපාදනය වන මුදල් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කළ යුතු වේ. | මෙවැනි අඩුපාඩුකම් ඉදිරියේ දී, සිදු නොවීමට වගබලා ගනිමි. |
| (ආ) | සභාව විසින් සෞඛ්‍ය වැඩසටහන් වෙනුවෙන් වැය විෂයන් 05 ක් සඳහා රු.310,000 ක් වෙන් කර තිබූ නමුත්, ඉන් රු.268,638 ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. | වෙන් කළ ප්‍රතිපාදන අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතු වේ. | ස්ථිර මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකු නොමැති බැවින්, අපේක්ෂිත කාර්යය ඉටු කිරීමට නොහැකි විය. |